## තිස්ස, 'ලංකා' සහ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ ලොවම සසල කළ සිර දඬුවමක් මාධ්‍යවේදියෙකුට නියම කළ අගෝස්තු 31වැනිදාට දිනකට පසු එම පනත යටතේම මාධ්‍යවේදීන් තිදෙනෙකු අත්අඩංගුවට ගත් පුවතක් වාර්තා වීමෙන් ශ්‍රී ලංකාවේ මාධ්‍ය මෙවර තරමක් කලබලයට පත් වූ බවක් පෙනිණ. විසි වසරක සිර දඬුවමක් මාධ්‍යවේදී තිස්සනායගම්ට හිමි වූයේ යුදමය තත්ත්වයක් යටතේ දෙමළ ජනතාවට සිදුවන හිරිහැර කිහිපයක් සිය ලිපිවලට ඇතුළත් කළ නිසාය. මානුෂවාදී ගැටළු වාර්තාකරණයට ගැනෙන එම ලිපි සහ ඒවා පළ කළ ''නෝත් ඊස්ටන් මන්ත්ලි'' සඟරාව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අපරාධයක් වීම නිසා මාධ්‍යවේදියකුගේ මුළු ජීවිතයම අඳුරට තීන්දු විය. එයින් ලෝකයම සසල කළත් ශ්‍රී ලංකාවේ මාධ්‍ය ක්ෂේත්‍රය එය එතරම් බරපතල ලෙස සැලකූ බවක් අදාල සතිය තුළ දක්නට නොලැබිණ. එයින් මතුවන අනාගත නපුර ගැන ඍජුවවත්, වක්‍රවත් අනතුරු ඇඟවූයේ මාධ්‍ය වාර්තා කිහිපයකින් පමණි. නමුත්, තිස්සනායගම්ට විසි වසරක බරපතල වැඩ ඇති සිර දඬුවමක් නියම වීම වාර්තා නොකළ, නැතිනම් ඉතාම සාමාන්‍ය සිදුවීමක් ලෙස වාර්තා කළ මාධ්‍ය පවා, ලංකා පුවත්පතේ මාධ්‍යවේදීන් තිදෙනා අත්අඩංගුවට ගත් පුවත වඩා ප්‍රමුඛතාවයකින් වාර්තා කළේය. එය පෙනෙන හැටියට මහජන මුදල් අයථා පරිහරණයට යොදා ගැනීම, දූෂණ වංචා වාර්තා ගණයට වැටෙන්නක් විය. එසේ වුවත්, මෙහිදීද ඔවුන් දෙමළ ජාතිකයන් නොවුණත් ජනතා විමුක්ති පෙරමුණේ නොනිල පුවත්පතක් වූ ලංකා පුවත්පතේ මාධ්‍යවේදීන් වූ නිසා වාර්තා කිරීමේ විවිධ කෝණද දකින්නට ලැබිණ. එමෙන්ම මාධ්‍ය මර්දනයට ඉතා භයංකාර ආකාරයට යොදා ගත හැකි ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සම්බන්ධ කතිකාව ගොඩ නැගීමට වඩා දායකත්වයක් දී තිබුණේ තිස්සනායගම් සිද්ධියේදී ඒ ගැන ප්‍රමුඛතාව දුන් මාධ්‍ය හා තවත් කිහිපයක් පමණි. මාධ්‍යවේදීන් ඇප මත නිදහස් කළ පසු එයින් සියල්ල විසඳුන ආකාරයකින් මාධ්‍ය සන්සුන් වූ බවක් පෙනෙන්නට තිබුණි. තත්ත්වය එසේ වුවත් තිස්සනායගම් නම් වූ දෙමළ මාධ්‍යවේදියාට අත් වූ ඉරණම ගැන හා ලංකා පුවත්පතේ සිංහල මාධ්‍යවේදීන් ගැන වාර්තා කිරීමේ වෙනසක්ම ඒ අතරින්ද කැපී පෙනෙන බව මාධ්‍ය නිරීක්ෂණයේදී කැපී පෙනෙයි.

තිස්සනායගම් නඩු තීන්දුව වාර්තා කළ ආකාරය නිරීක්ෂණය කළේ, නඩු තීන්දුව දුන් දා සිටය. ලංකා මාධ්‍යවේදීන් සම්බන්ධයෙන් මාධ්‍ය නිරීක්ෂණය කරන ලද්දේ අත්අඩංගුවට ගත් පුවත වාර්තා කළ මුල් දින කිහිපයේ (සැප්. 3 සිට 6දක්වා) වාර්තා අත් හැර එනම්, සැප්තැම්බර් මස 7 සිට 13 වැනිදා දක්වා දින හයක කාලයකි. ලංකා මාධ්‍යවේදීන් වන රවීන්ද්‍ර පුෂ්පකුමාර, ශාලික විමලසේන සහ දයා නෙත්තසිංහ දෙනියායේදී අත්අඩංගුවට ගත්තේ සැප්තැම්බර් මස 02දාය. පෞද්ගලික ඉඩමක කෙරෙන ඉදිකිරීම් ගැන සොයා බලන්නට අනවසරයෙන් ඇතුළු වීම එයට හේතුව ලෙස මුලින් කියැවිණ. එය ජනාධිපතිවරයාගේ සහෝදරියකට අයත් එකක් බවත් ජනාධිපතිවරයා එහි යන එන බැවින් සැක කටයුතු නිසා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගත් බවත් පසුව කියැවිණ. කෙසේ වුවත් මෙම අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් ජනතා විමුක්ති පෙරමුණ විශාල හඬක් නැගීමත්, ඔවුන්ගේ මූලිකත්වයෙන් උද්ඝෝෂණයක් දියත් වීමත් නිසා ආණ්ඩුව හා ජනතා විමුක්ති පෙරමුණ අතර ඇති දේශපාලන විරසක වීම සම්පූර්ණ පළිගැනීමක් දක්වා දිගු නොවී (දෙමළ මිනිසුන් ගැන කතා කළ දෙමළ මිනිසුන් හෝ සිංහල මිනිසුන් නොවුණ නිසා) ඔවුන් ඇප මත මුදා හැර ඇත. අදාල කාලය තුළ වාර්තා වූයේ ඔවුන් ඇප මත මුදා හැරීම, තමන්ද ඡන්දය දුන් හදිසි නීතිය තමන්ට එරෙහි වීම ගැන ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රකාශ, විපක්ෂ නායකවරයා ඇතුළු විපක්ෂ දේශපාලනඥයන් මාධ්‍යවේදීන් අත්අඩංගුවට ගැනීම හා රජයේ මාධ්‍ය මර්දනයට එරෙහිව කළ ප්‍රකාශ, මාධ්‍ය මර්දනයට ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යොදා ගැනීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේදී විපක්ෂ දේශපාලනඥයන් කළ ප්‍රකාශ, ආණ්ඩුවේ දේශපාලනඥයන් එය ආරක්ෂා කිරීමට දුන් පිළිතුරු, හදිසි නීතියට ඡන්දය නොදී ජනතා විමුක්ති පෙරමුණ සභා ගැබෙන් පිටවීම, ඒ සම්බන්ධයෙන් ජවිපෙට එරෙහි ප්‍රහාර ආදියයි.

මුල් දින කිහිපයේ වාර්තා හැර නිරීක්ෂණය කළ සතිය තුළ (සැප්තැම්බර් 7-13) සිංහල පුවත්පත්වල වාර්තා (පුවත්/විශේෂාංග/කතුවැකි) 49ක් ලංකා මාධ්‍යවේදීන්ගේ සිදුවීම

PDF created with pdfFactory Pro trial version www.pdffactory.com

සම්බන්ධයෙන් පළ වී තිබුණි. (සිදුවීමට පසු දින ප්‍රධාන පුවත්, මුල් පිටුවේ වාර්තා ගණනාවක් දකින්නට ලැබිණ.) ඊට පෙර සතියේ (අගෝස්තු 31- සැප්තැම්බර් 6) තිස්සනායගම් නඩු තීන්දුව සම්බන්ධයෙන් පළ වී තිබුණේ වාර්තා 22කි. වාර්තා වීමේ අවස්ථා ගණනේ පැහැදිලි වෙනස්කමක් සිංහල පුවත්පත්වලින් පෙනෙයි. සිදුවීම් දෙක හරහාම පැහැදිලි ස්ථාවරයකින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත මාධ්‍ය මර්දනයට යොදා ගන්නා අවිචාරවත් ආකාරය ගැන මෙන්ම එහි අනතුර ගැන ප්‍රශංසනීය වාර්තාකරණයක යෙදී තිබුණේ එක් ඉරිදා පුවත්පතකි. සමහර පුවත්පත් සිදුවීම් වාර්තා කළ අතර, තවත් ඒවා මාධ්‍ය මර්දනයට විරුද්ධ නමුත් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ වැදගත්කම වර්ණනා කරමින් වාර්තා කර ඇත. ඒවා තිස්සනායගම් නඩු තීන්දුව ගැන කිසිවක්ම වාර්තා නොකර සිටීමේ අර්ථය මෙයින් පාඨකයනට වටහා ගත හැකිය. ඒ අතර රජයේ මාධ්‍ය මෙන්ම රජයේ යුද මතවාදය හා සමගාමී සමහර මාධ්‍ය වාර්තාවලින් සිදුවීම් සාධාරණීකරණය කරමින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතද සාධාරණීකරණය වන ආකාරයට වාර්තා කර තිබිණ. තිස්සනායගම් ජාතිවාදීව හා ත්‍රස්තවාදයට සහාය දුන් වරදකරුවකු බව පිළිගනිමින් දඬුවම සාධාරණීකරණය කරන ආකාරයට වාර්තා කළ අතර, ලංකා මාධ්‍යවේදීන් පෞද්ගලික ඉඩමකට අනවසරයෙන් ඇතුළුව ඡායාරූප ගැනීමෙන් සැක කටයුතු ලෙස හැසිරීම වරදක් බව පුන පුනා කියන ආකාරයෙන් වාර්තා කර ඇත. ඊට අමතරව මෙම සිදුවීම නිසා හදිසි නීතියට ඡන්දය දීමෙන් වැළැකී සිටි ජනතා විමුක්ති පෙරමුණ දැඩි සේ විවේචනය කරන වාර්තා සහ කතු වැකි ලියා තිබිණ. ජනතා විමුක්ති පෙරමුණ හදිසි නීතියට පක්ෂව කටයුතු කර තමන් වෙතටම තුවක්කුව එල්ල වූ අවස්ථාවේ වුව මේ ආකාරයට වෙනස් වීම සාධනීය පියවරක් ලෙස තවත් ස්වාධීන පුවත්පත් කිහිපයක් කතිකා කර තිබිණ. මෙම සිදුවීමේදී ආණ්ඩුව පාර්ශ්වයෙන් එල්ල වූ ප්‍රබල චෝදනාව වූයේ මාධ්‍යවේදීන් තම සදාචාරාත්මක සීමාව ඉක්මවා කටයුතු කර ඇති බවයි. මේ පිළිබඳව ඉතා වැදගත් විග්‍රහයක් 'ඉරිදා ලංකාදීප' පළ කර ඇත. ඒ අනුව, කෙනෙකුගේ පෞද්ගලිකත්වයට ගරු කිරීම මාධ්‍ය ආචාර ධර්මවල ප්‍රධාන කාරණයක් වන නමුත්, එහි මහජනයාට දැන ගැනීමට අයිතිය ඇති කාරණයක් තිබේනම් එය වාර්තා කිරීමට මාධ්‍යවේදීන්ට ඇති අයිතිය ආචාරධර්ම අනුවම කළ හැකිය. උදාහරණ සහිතව ඒ බව පෙන්වා දෙයි. රජයේ මුදල් සහ සම්පත් යොදා ගනිමින් පෞද්ගලික ඉඩමක ඉදිකිරීමක් සිදුවන්නේ නම් එය මහජන සුබ සිද්ධියට අදාලව මහජනයා දැනගත යුතු කාරණයකි. රජයේ දේපළ යනු මහජන දේපළයි. ඉදිකිරීම සිදුවන්නේ රජයේ හෝ පොදු දේපළක නොවන හෙයින් මහජන සම්පත් යොදවා පෞද්ගලික ඉඩමක ඉදි කිරීමක් වන විට එය මහජනයා දැන ගත යුතුමය. මෙම මාධ්‍යවේදීන් ඇතුල් වූ ස්ථානය පමණක් නොව ඕනෑම එවැනි තැනක තොරතුරු දැන ගැනීමට මහජනයාට අයිතිය ඇත. එවැනි කරුණක් ආරංචි වූයේ නම් මහජනයා වෙනුවෙන් ඒවා සොයා වාර්තා කිරීමේ අයිතිය මාධ්‍යවේදීන්ට ඇත. මෙහිදී වලංගු වන්නේ පෞද්ගලිකත්වයට අදාල සදාචාර නීතිය නොව මහජන සුබ සිද්ධියට අදාලවීම පිළිබඳ සදාචාර නීතිය බව මෙම ලිපියෙන් ඉතා පැහැදිලිව වාර්තා කර තිබීම විශේෂය. මෙම ප්‍රවේශය තරමක් දුරට ඇතුළත් නමුත් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ අනතුර පිළිබඳ වැඩි අවධානය යොමු කළ තවත් ලිපියක් 'රාවය' පුවත්පතේ කැපී පෙනෙයි. මෙම වාර්තා හරහා කරුණු කිහිපයක් අනාවරණය කරයි. ''ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත කෲර අමානුෂික කැලෑ නීතියකි, එයින් අත්තනෝමතික ලෙස විරුද්ධවාදීන් මර්දනය කිරීමට රජයට හැකිය, මාධ්‍ය බියපත් කිරීමට හා මර්දනය කිරීමට හැකිය, රජයට විනාශ කිරීමට හා බය කිරීමට අවශ්‍ය අය වෙනුවෙන් එය භාවිතා කළ හැකිය'' යනාදී කරුණු විශේෂ වශයෙන් හෙළිදරව් කරයි. එමෙන්ම අවි අතැතිව ත්‍රස්ත ක්‍රියාවලට දායක වූ නායකයන් වූ කරුණා අම්මාන්, පිල්ලෙයාන් ඇමැතිකම් දරද්දී, දයා මාස්ටර්, ජෝර්ජ් මාස්ටර් නිදහස ලබද්දී පැනෙන් තම ජනතාවගේ වේදනාව ගැන ලියූ මාධ්‍යවේදියකුට අමානුෂික සිර දඬුවම් නියම කිරීමෙන් මෙම නීතිය වෙනස් සැළකුම් සහිතව භාවිතා කළ හැකි ආකාරයද පසුව සඳහන් කළ ලිපියේ මාධ්‍යවේදියා පෙන්වා දී ඇත.

සිංහල මාධ්‍යය මෙන් සිදුවීම් දෙක සම්බන්ධ වාර්තාකරණයේ පරස්පරයක් නොමැතිව වාර්තා කරන්නට දෙමළ මාධ්‍ය කටයුතු කර ඇත. මුල් සිදුවීම සම්බන්ධ වාර්තා 33ක් දක්නට ලැබුණු අතර දෙවැනි සිදුවීම සම්බන්ධ වාර්තා 35ක් පළ වී තිබුණි. ''ත්‍රස්තවාදය අවසන් කර ඇත්නම් එයින් ජනතාවගේ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසට තර්ජනයක් නැත්නම් දෙලක්ෂ පනස් දහසක් සිවිල් ජනතාව වව්නියාවේ රඳවා තබා ගෙන ඉන්නේ මොන නීතියක් යටතේද?'' යනුවෙන් විපක්ෂ නායකවරයා ඇසූ ප්‍රශ්නයකට දෙමළ පුවත්පත් ප්‍රමුඛතාවක් දී ඇත. එක් දෙමළ පුවත්පතක් එය ප්‍රධාන පුවත ලෙස වාර්තා කරමින් මර්දන නීති සම්බන්ධ අවධානය යොමු

PDF created with pdfFactory Pro trial version www.pdffactory.com

කරවයි. සිදුවීමට දින කිහිපයකට පසුව නිරීක්ෂණය ආරම්භ කළද එම කාලය තුළද ප්‍රධාන පුවත් 3ක් ලංකා මාධ්‍යවේදීන්ගේ සිදුවීම හා අදාල පුවත් සඳහා වෙන් කර ඇත. එක් කතුවැකියකින් සමහර සිංහල මාධ්‍ය මෙන්ම මෙතෙක් හදිසි නීතියට පක්ෂ වූ ජනතා විමුක්ති පෙරමුණ වෙත තුවක්කුව දිගු වී ඇති ආකාරයත් ප්‍රමාද වී හෝ තීරණයක් ගත යුතු ආකාරයත් පැහැදිලි කරයි.

ඉංග්‍රීසි පුවත්පත් වාර්තාකරණයද, දෙමළ මාධ්‍ය මෙන් සිදුවීම් දෙකටම අදාලව සමාන කමක් දක්නට ඇත. අදාල කාලය තුළ පමණක් වාර්තා ගණනින් 17කි. තිස්සගේ නඩු තීන්දුව සඳහා අවස්ථා 21ක් පමණ ලැබී තිබුණි. කෙසේ වුවත් එක් ඉංග්‍රීසි පුවත්පතක් සිදුවීම් දෙකේදීම සමබර වාර්තාකරණයක යෙදී ඇති අතර එක් සති අන්ත පුවත්පතක් වැඩි ඉඩක් වෙන්කරමින් අත්අඩංගුවට ගැනීමේ අත්තනෝමතිකත්වය සිය පාඨකයනට පැහැදිලි වන ආකාරයට වාර්තා කරයි.

රූපවාහිනී වාර්තා 12ක් පමණ ඉදිරිපත් වූ අතර සිරස මාධ්‍ය ජාලයේ වාර්තා සමබර හා අනතුර ගැන අවධාරණය වන ආකාරයට වාර්තා කර තිබිණ. වාර්තා කිහිපයකට පදනම් වී තිබුණේ පාර්ලිමේන්තුවේදී මාධ්‍ය මර්දනය සම්බන්ධ ප්‍රකාශයන්ය. හදිසි නීතියට ජවිපෙ ඡන්දය නොදීම හා වැඩි ඡන්දයෙන් සම්මත වීම මෙදින මෙම සිදුවීම සමඟ සමපාත වන ආකාරයට වාර්තා වී තිබිණ. රජයේ රූපවාහිනී මාධ්‍යවලට පදනම වූයේ හදිසි නීතිය සම්මත වීමයි.

කුමණ දේශපාලන මතිමතාන්තරවලට ගැතිව සිදුවීම් දෙස බලමින් පක්ෂග්‍රාහී වාර්තාකරණයක යෙදුනත්, මර්දනකාරී අණපනත් අත්තනෝමතිකව භාවිතා කළ හැකි දේශපාලන බල අධිකාරයකට ඒ කවරකු වෙත වුව මර්දනයේ දඬු අඬු දිගු කරන්නට විචාරයක් අවශ්‍ය වන්නේ නැත. මාධ්‍යයට ආරක්ෂාව ඇත්තේ එයට බියවී සිටීමෙන් නොව මහජන යහපත සඳහා අපක්ෂපාතීව මෙන්ම අනාගතය දකිමින් වාර්තා කිරීමෙන්ම පමණි. සියළු දෙනා එක්වූ කළ, මහජනයා වෙනුවෙන් භේදයකින් තොරව පෙනී සිටීම තුළ නිහඬතාවට හා පක්ෂග්‍රාහිත්වයට වඩා වැඩි ආරක්ෂාවක් ඇත.

**සීතා රංජනී**
**seetha@cpalanka.org**

PDF created with pdfFactory Pro trial version www.pdffactory.com